# වී උපත පිළිබඳ ඓතිහාසික තොරතුරු වලින් බිඳක්...........

වසර 7,000 කට පෙර චීනයේ හා ඉන්දියාවේ ද වසර 6,000 කට පෙර සියම් දේශයේත් වී වගාව සිදු කෙරෙන්ට ඇතැයි ප්‍රාග් ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය වේ. වී ප්‍රභේද 7,000 - 8,000 අතර සංඛ්‍යාවක් එකල වගා කර ඇති බවට ද ගණන් බලා ඇත. ඉන් 4,000 ක් පමණ අදත් ලොව පුරා ගොවීහු වගා කරති. මිනිසා ගොවිතැන් ක්‍රම ඇරඹූ මුල් කාලයේ දී විවිධ ධාන්‍ය විශේෂ දැන හැඳින ඒවා ආහාරයට ගෙන රස ගුණ දැනගත් පසු එම භෝග වර්ගයන් ස්ථිරව වගා කරන්නට ඇතැයි සිතිය හැකිය. ඉපැරණි සභ්‍යත්වයක් පැවති චීනයේ, ඉන්දියාවේ සහ සියම් දේශයේ විවිධ ධාන්‍ය ප්‍රභේද භාවිතා කළ බවට සාධක ලැබී ඇති හෙයින් එකම වකවානුවක එම රටවල් වලත් අනෙක් ආසියානු රටවලත් වී වගාව සිදුකරන්නට ඇත. ඒ අනුව වී පැලයේ නිජබිම ලෙස ආසියාව සැලකිය හැකිය. වසර 5,000 කට පෙර අප්‍රිකාවේත්, වසර 3,000 කට පෙර ශ්‍රී ලංකාවේත් වී වගාව සිදුකෙරුණු බවට ඓතිහාසික තොරතුරු පවතී. එම කාලවකවානු වල දී, ජාවා හා ඒ අවට දූපත් වලටත්, මධ්‍යම අප්‍රිකානු ප්‍රදේශවලටත් ඉන්දියාවෙන් වී වගාව ව්‍යාප්ත වී ඇත. වසර 2,500 කට ඉහත සෝවියට් දේශයේ කසිකිස්ථානය, උස්බෙකිස්ථානය හා කොකේසියානු ප්‍රදේශවල වී වගා කෙරිණි. 18 වෙනි සියවසේ දී රුසියාවේ වෝල්ගා (ආස්ත්‍රඛාන්), කැබාන් (උතුරු කොකේසියා), තෙරෙක් (ආර්මේනියා) යන ගංගා නිම්නවල ආරම්භ වූ වී වගාව එරට දකුණු හා නැගෙනහිර දෙසට පැතිරුණු බවට සාක්ෂි ඇත.

වසර 4,000 කට ඉහත දී පිලිපීනයටත්, වසර 3,500 කට පෙර ඉන්දුනීසියාවටත්, වසර 3,000 කට පෙර ජපානයටත් වසර 2,300 කට පෙර (ඉන්දියාව ආක්‍රමණය කළ මහා අලෙක්සැන්ඩර්ගේ හමුදා මගින්) ග්‍රීසියටත් මධ්‍යධරණී ප්‍රදේශයේ රටවලටත් පැතිරුණු වී වගාව එතැනින් දකුණු යුරෝපයට හා උතුරු අප්‍රිකාවට පැතිර ගොස් ඇත. ඇමරිකාවේ පහත් බිම් වලට වී හඳුන්වා දුන්නේ මැඩගස්කරයෙන් පැමිණි වහලුන් විසින් යැයි සැලකේ. ලෝකයේ ඇති වගාකළ හැකි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1,342,826,000 න් 11% ක් පමණ, එනම් හෙක්ටයාර් 146,452,000ක වී වගා කෙරේ. මෙසේ සෑම මහද්වීපයකම පැතුරුණු වී වගාවෙන් 91.7% ක් සංවර්ධනය වන රටවලට අයත්වන අතර ඉතිරිය සංවර්ධිත රටවලට හිමිවේ.

කිරන්තිඩියේ පසද්කද සේකර හිමියන්ගේ වී වරුණ ග්‍රන්ථයට අනුව ලෝකය හා සැසඳීමේදී අසල්වැසි ඉන්දියාවේ හෙක්ටෙයාර 42,034,000 ක වී වගා කරනු ලැබේ. එය ලොව වගා බිම් වලින් 29%කි. කෙසේ වෙතත්, ලෝක වෙළඳාමට සම්බන්ධ වන්නේ බත් සුලභව පරිභෝජනය කරන රටවල් වෙනත් රටවලින් මිල දී ගන්නා නිසාවෙනි. ඒ අනුව සියම් දේශය, ඉන්දියාව, මියන්මාර, පාකිස්තානය, චීනය හා ඇමරිකාව ප්‍රධාන නිර්යාතකරුවෝ වෙතැයි "වී වරුණ" ග්‍රන්ථයෙහි වැඩිදුරටත් සඳහන් වේ.

**සරත් විජයගුණවර්ධන**